**ii පත්‍රය**

**කාලය පැය 1 මිනිත්තු 15**

1. පහත සඳහන් ඡේදය කියවා එය ඇසුරින්ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

අපි රෝදපාර දිගේ වනය තුලට රිංගුවෙමු. තොරතේංචියක් නැතිව නැඟෙන කුරුළු ගීතයෙන් නිහැඬියාව මැකී යයි. මිනිස් කටහඬක් අසන්නට නැති බැවින් කුරුළු ගීතය වුවද සිත සලින කරවීමේ බලයක් ලබා ඇත. ගස් දෙකක් එකට ඇතිල්ලී නැඟෙන ක්‍රීං.....ක්‍රීං නාදය ගස් අතරින් රිංගා ඇනටම දිව යයි. අත්තෙන් අත්නට පනින රිලා වඳුරු සේනාව අප දෙස බලා සිටින්නේ අප බයගන්වන විලාසයකිනි. කන් බිහිරි කරවන රැහැයි නාදය වන ගැඹේ පාළුවට තර්ජනයක් වුවද සිත තුල රජයන පාළුව බිය මුසු හැඟීම් ජනනය කරවයි.

i. ඡේදයේ කියවෙන්නේ කුමන පරිසරයක් පිළිබඳවද?

.....

ii. නිහැඬියාව මැකී යන්නේ කුමකින්ද?

.....

iii. ඉතාම දැඩි ශබ්දයක් යැයි හැඟීමට යොදා ඇති කියමන කුමක්ද?

.....

iv. ඡේදයේ ඇති උත්තම පුරුෂ බහු වදන ක්‍රියා පදය තෝරා ලියන්න?

.....

v. සෑම අකුරකටම පාපිලි පමණක් යෙදී ඇති වචනයක් තෝරා ලියන්න?

.....

vi. "රංචුව "යන්නට ඡේදයේ ඇති පදය කුමක්ද?

..... (ල.1x6)

2. පහත සඳහන් කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

පෙරදිග ලෝකයේ බබලන මුතු ඇටය
පණ ඇති මහා සමුදුරු පවුරෙන් වටය

.....

..... (ල.1)

3. පහත තේරවිලි වල ඉතිරි පද සම්පූර්ණ කරන්න.

i. හෙණ දළ

හෙණ නම් අකුණු

දළ නම්.....

අකුණු.....

ii. වන්දි මුදල

වන්දි නම් දඩ

මුදල නම්.....

.....කඩදාසි (ල.2)

4. නිවැරදි අක්ෂර විනාසය සහිත වචනය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

i. බුද්ධිමත්/රාජදානිය/ප්‍රතිසංස්කරන/පනිවිඩ

ii. සමෘද්දිමත්/පරිගනක/සාකච්ජාව/කාර්යක්ශම (ල.2)

5. ගැළපෙන විරුද්ධාර්ථ පදය ලියන්න.

i. ප්‍රශ්න - .....

ii. ආරම්භය - .....

iii. සෙමෙන් - .....

iv. මහත - ..... (ල.4)

6. පහත සඳහන් ප්‍රස්ථාව පිරුළුවල හිස්තැන් පුරවන්න.

i. ඉදිකටුවයි.....වගේ

ii. මඩේ හිටවපු.....වගේ (ල.2)

7. පහත ඉඟි පදවල තේරුම ලියන්න.

i. ඉහේ මලක් පිපුණා - .....

ii. එක හුස්මට - ..... (ල.2)

8. හිස් තැනට සුදුසු පදය වරහන් තුලින් තෝරා ලියන්න.

i. ඈ ගමට .....(ගියේය/ගියාය)

ii. මිනිස්සු රැස්වීමට.....(යයි/යති)

iii. සරත් රචනාවක්.....(ලිව්වේය/ලිව්වාය) (ල.3)

www.lkedu.lk

9. පහත කොටුවේ ඇති ගැළපෙන වචන පමණක් තෝරාගෙන හිස්තැන් පුරවන්න.

මහත, කිරි, පීර, ලාම්පුව, නුවණ, වාදනය, දූපත, වැය

| ඉ ශබ්දය | ප ශබ්දය | උ ශබ්දය | ඌ ශබ්දය |
|---|---|---|---|
| | | | |

(ල.4)

10. දී ඇති වාක්‍යවල හිස් තැනට යෙදෙන පදය වරහන් තුලින් තෝරා යටින් ඉරක් අඳින්න.

i. I .....Sarath (am/is/are)

ii, We.....friends (am/is/are) (ල.2)

11. පහත වාක්‍ය ඉංග්‍රීසි බසින් ලියන්න.

i. අම්මා බත් උයමින් සිටියි..... (ල.1)

12. පහත වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහල අකුරෙන් ලියන්න.

i. පූසා කොහේද?.....
ii. මට බඩගිනියි ..... (ල.2)

13. පහත සඳහන් දෙමළ වාක්‍යයේ අර්ථය සිංහලෙන් ලියන්න

අම්මා ඉරුක්කිරාර් - ..... (ල.1)

14. මම පුවත්පතක් වෙමි. මාතෘකාව යටතේ උක්ත අක්‍යාත නිවැරදි වැකි 3 ක් ලියන්න .(සෑම වාක්‍යයක්ම වචන 5කට වැඩි විය යුතුය)

i.....
ii.....
iii..... (ල.2)


15. දී ඇති සංඛ්‍යා රටාවල ඊලඟ සංඛ්‍යාව ලියන්න.

i. 4, 12, 20, .....

ii.50, 44, 38, ..... (ල.2)

www.ikedu.lk

16.



i.මෙම රූපයේ ඇති ත්‍රිකෝණ ගණන කීයද?

.....

ii.මෙම රූපය සමමිතිකව බෙදෙන රේඛාව අඳින්න?

(ල.2)

17. සරත් A නම් ස්ථානයේ සිට මීටර් 50 ක් දකුණු දිශාවට ගමන් කර ඉන් පසු ඔහුගේ වම් අත පැත්තට මීටර් 50 ක් ගමන් කර නැවත ඔහුගේ වම් අත පැත්තට මීටර් 50 ක් ගමන් කර දකුණු අත පැත්තට මීටර් 20 ක් ගමන් කර E නම් ස්ථානයට පැමිණෙයි. E පිහිටා ඇත්තේ කර A සිට කුමන දිශාවේද?

..... (ල.2)

18. i. දී ඇති රෝම සංඛ්‍යාවට පසුව එන රෝම සංඛ්‍යාව ලියන්න.

lx - .....

ii. රෝම ඉලක්කමෙන් ලියන්න.

29 - ..... (ල.2)

19. සවස 4 ට පමණ මා නගරයේ සිට ගෙදර එමින් සිටිය දී මගේ සෙවනැල්ල මා පසු පස පැමිණියේ නම් කවර දිශාවක් බලා මා ගමන් කරමින් සිටියේද?

..... (ල.2)

20. දැන් මගේ වයස අවුරුදු 11 ක් වන අතර මල්ලිගේ වයස අවු.4 ක් වේ.මගේ වයස මල්ලිගේ වයස මෙන් දෙගුණයක් වන්නේ තව අවුරුදු කීයකින්ද?

..... (ල.2)

21. පාසලක ක්‍රීඩා උත්සවයක් වෙ.11.00 ට ආරම්භ විය. එය පැය 3 යි මිනිත්තු 45 කින් අවසන් විය.එය අවසන් වූ වේලාව පැය 24 ඔර්ලෝසු වේලාවෙන් ලියන්න.

..... (ල.2)

22.නිමල් හා කමල් යන දෙදෙනාගේ බරෙහි එකතුව 60 kg ද කමල් හා අමල් යන දෙදෙනාගේ බරෙහි එකතුව 64 kg ද නිමල් ,කමල් හා අමල් යන තිදෙනාගේ බරෙහි එකතුව 98 kg ද වේ.

i.අමල්ගේ බර කීයද? .....

ii.නිමල් හා අමල්ගේ බරෙහි එකතුව කීයද?

..... (ල.2)


www.lkedu.lk

23. පහත සඳහන් බිල්පත සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍යය | ප්‍රමාණය | ඒකක මිල<br>රු. ශ | මුදල |
|---|---|---|---|
| පරිප්පු | 4kg | 65. 00 | ..... |
| තේ කුඩු | 250g | 640. 00 | ..... |
| පාන් පිටි | 2kg | ..... | 190.00 |
| මිරිස් කුඩු | 500g | 520. 00 | 260.00 |
| මුළු මුදල | | | ..... |

(ල.2)

24.




වර්ග ඵලය 1 $cm^2$ බැගින් වූ සම චතුරස්‍රවලින් මෙම රූපය සමන්විත වේ.

i. පාට කර ඇති කොටසේ වර්ගඵලය වර්ග සෙන්ටි මීටර් කීයද? .....

ii. එහි පාට කර ඇති කොටස මුළු රූපයෙන් කුමන භාගයක්ද?..... (ල.2)

25.




i. මෙහි ඇති ඉලක්කම් සියල්ලම යොදාගෙන සෑදිය හැකි විශාලම සංඛ්‍යාව අකුරෙන් ලියන්න.
.....


ii. එම ඉලක්කම් සියල්ලම යොදා ලිවිය හැකි කුඩාම සංඛ්‍යාව ලියා එය විහිදුවා ලියන්න.
.....

(ල.2)

26. ටැංකියක ධාරිතාව ලීටර් 10 කි. සුනිල් වරකට ලීටර් 4 බැගින් දමමින් ටැංකියට ජලය පුරවයි. ඒ සෑම වාරයකටම පසු ඔහුගේ මල්ලී ලීටර් 2 ක් ඉවත්කර ගනී. මුලින්ම ටැංකිය ජලයෙන් පිරේන්නේ සුනිල් කී වරක් ජලය දැමූ පසුද?

..... (ල.2)

27.



i. මෙහි මුහුණත් කීයද? .....

ii. දාර කීයද? .....

(ල.2)

28. එක් අයෙකුට පැන්සල් 5 බැගින් ළමයි 25 දෙනෙකුට දීමට අවශ්‍ය පැන්සල් ගණන කීයද?

..... (ල.2)

29. හිස් කොටුවට එන අගය ඉදිරියේ ඇති හිස් කොටුවේ ලියන්න.

i. 4 5 7
3□4
1 3 3

ii. 8 4 6
1□2
9 9 8

(ල.2)

**30 සිට 60 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරන්න.**

30. පෙළපොත් භාවිතා කිරීමට අදාළ යහපුරුද්දක් නොවන්නේ,
    i. පෙළපොත් වලට පිට කවර දැමීම.
    ii. කියවා නතර කළ ස්ථානය දැන ගැනීමට පෙළපොතේ කොළ නැමීමය.
    iii. බෑගයට පොත් දමන විට සැලකිල්ලෙන් දැමීමය.

31. ශ්‍රී ලංකාවේ ජාතික ගීයේ රචකයා වන්නේ මින් කවරෙක්ද?
    i. මාපලගම විපුලසර හිමි
    ii. මර්සිලින් ජයකොඩි පියතුමා
    iii. ආනන්ද සමරකෝන් මහතා
    iv. සුනිල් ශාන්ත මහතා

32. බ්‍රිතාන්‍ය ජාතිකයින් ඔවුන්ගේ රටට ගෙන ගිය සිංහ අයිති රජතුමා කවුරුන්ද?
    i. මහසෙන් රජතුමා
    ii. වසභ රජතුමා
    iii. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා
    iv. දුටුගැමුණු රජතුමා

33. බළලෙකුගේ හඬින් නාද කළ හැකි පක්ෂියා වන්නේ,
    i. කවුඩා
    ii. පොල්කිච්චා
    iii. කොහා
    iv. කහ කුරුල්ලා

34. පත්‍ර මගින් පැළ ලබා ගත හැකි ශාකය වන්නේ,
    i. කජු
    ii. අක්කපාන
    iii. පොල්
    iv. ඇන්තූරියම්

35. ශ්‍රී ලංකාවේ හොඳම සඳකඩපහන දැකිය හැක්කේ,
    i. මිහින්තලයේ කණ්ඨක චෛත්‍ය අසලය.
    ii. මහනුවර දළදා මාළිගයේය.
    iii. අනුරාධපුර බිසෝ මාළිඟයේය.
    iv. රුවන්වැලි සෑය අසලය.

www.lkedu.lk

36. කිණිහිර යොදා ගනු ලබන්නේ,
   i. ධීවර කර්මාන්තයේදීය
   ii. පතල් කර්මාන්තයේදීය
   iii. කෘෂි කර්මාන්තයේදීය
   iv. කම්මල් කර්මාන්තයේදීය

37. ප්‍රෝටීන් බහුලව ඇති එළවළු වර්ගය වන්නේ,
   i. දඹල
   ii. මස්
   iii. නිවිති
   iv. බිත්තර

38. බල්ලකු සපා කෑ විට ප්‍රථමයෙන් කළ යුත්තේ,
   i. අත් බෙහෙත් දැමීම
   ii. සපා කෑ ස්ථානය රෙදි පටිවලින් වෙලීම
   iii. ගලා යන පිරිසිදු ජලයෙන් සපා කෑ ස්ථානය සබන් දා සේදීම
   iv. රෝහලට රැගෙන යාම

39. කහපාට පසුබිමක පහත මාර්ග සංඥාව ඇඳ ඇත්නම් ඉන් කියවෙන්නේ,



   i. පදික මාරුව
   ii. ළමයින් පාර මාරුවන ස්ථානය ඉදිරියේම
   iii. ළමයින් පාර මාරුවන ස්ථානය
   iv. පාසලක්

40. සිනියම්වල ඇති අධීවේගී මාර්ග දක්වා ඇති වර්ණය වන්නේ,
   i. රතු
   ii. දම්
   iii. කළු
   iv. කහ

41. රාත්‍රී කාලයේ පිපෙන මල්වල විශේෂත්වය වන්නේ,
   i. පොකුරු ලෙස පිපීමයි
   ii. සුවඳ හැමීමයි
   iii. සුදු පාට වීමයි
   iv. වැල්වල පිපීමයි

42. ශ්‍රව්‍ය, දෘෂ්‍ය සන්නිවේදන මාධ්‍ය වන්නේ,
   i. ගුවන් විදුලිය
   ii. දුරකථනය
   iii. රූපවාහිනීය
   iv. පුවත්පත

www.lkedu.lk

43. ජන ක්‍රීඩාවක් නොවන්නේ,
    i. එළුවන් කෑම
    ii. fම්වරකෙළිය
    iii. ටොපි ඇහිදීම
    iv. ඔළිඳ කෙළිය

44. තම වරිගයේ අයගේ ලෙඩ දුක් සුව කර දෙන ලෙස දෙවියන්ගෙන් ඉල්ලා ආදීවාසීන් කරනු ලබන ශාන්ති කර්මය වන්නේ,
    i. කිරි කොරහ තැබීමය
    ii. දොඩම් පෙරහැර
    iii. ගලේ බණ්ඩාර දෙවියන් වැඳීමයි
    iv. කොළ අතු එල්ලීමයි

45. තම ජීවන චක්‍රයේ වැඩි කාලයක් ජලයේ ගත කරන්නේ,
    i. කිඹුලා
    ii. කැස්බෑවා
    iii. මදුරුවා
    iv. ඉබ්බා

46. පැරණි හටන් කාව්‍යවල "නොමදින් විකුම් පාලා" ගීතයේ කියවෙන්නේ,
    i. පෘතුගීසින් ගැනය.
    ii. ලන්දේසීන් ගැනය.
    iii. ඉංග්‍රීසින් ගැනය.
    iv. සිංහලයන් ගැනය.

47. ඉක්මනින් ම පැළ වන බීජ වර්ගය වන්නේ,
    i. අඹ
    ii. මිරිස්
    iii. කව්පි
    iv. බටු

48. ශ්‍රී ලංකාවේ බස්නාහිරින් පිහිටි රට වනුයේ,
    i. මැලේසියාව
    ii. තායිලන්තය
    iii. අප්‍රිකාව
    iv. ඉරානය

49. ජලජ ශාකයක් නොවන්නේ,
    i. නිල් මොනරැස්ස
    ii. දිය බෙරලිය
    iii. හබරල
    iv. කෙකටිය

www.lkedu.lk

50. අයඩින් අඩුවීමෙන් සෑදිය හැකි රෝගයක් වන්නේ,
    i. ගලපටලය
    ii. අඳුම
    iii. ගලගණ්ඩය
    iv. පාචනය

51. දණ්ඩ චුම්බකයක වැඩි චුම්බකත්වයක් දැකිය හැක්කේ,
    i. චුම්බකයේ මධ්‍යයේ
    ii. චුම්බකයේ උත්තරත් ධ්‍රැවයේ
    iii. චුම්බකයේ දක්ෂිණ ධ්‍රැවයේ
    iv. චුම්බකයේ දෙකෙළවර

52. ජලය වීදුරුවකට අයිස් කැටයක් දැමූ විට,
    i. ගිලෙයි
    ii. පාවෙයි
    iii. ගිලීපාවෙයි
    iv. වාෂ්පවෙයි

53. වෙළඳපොළට ගොස් මාළු මිලදී ගැනීමේදී සලකා බැලිය යුත්තේ,
    i. කරමල රතුපාට නිබේදැයි බැලීම
    ii. හොඳින් සෝදා ඇත්දැයි බැලීමය
    iii. දුඟදක් හමන්නේදැයි බැලීමය
    iv. ඇස් දීප්තිමත්ව නිබේදැයි බැලීම

54. කෝළම් රටා අඳිනු ලබන්නේ,
    i. කතෝලික ආගමික උත්සව වලදීය.
    ii. බෞද්ධ ආගමික උත්සව වලදීය.
    iii. හින්දු ආගමික උත්සව වලදීය.
    iv. ඉස්ලාම් ආගමික උත්සව වලදීය.

55. ඉතාම ජනප්‍රිය ගීතයක් වන "පිනවන දුටු දන සැම ....." ගීතය ලියා ඇත්තේ,
    i. පී.බී.අල්විස් පෙරේරා මහතාය.
    ii. එස්. මහින්ද හිමිය.
    iii. ආනන්ද රාජකරුණා මහතාය.
    iv. ගජමන් නෝනාය.

56. විද්‍යුත් නැපෑල මගින් කළ නොහැක්කේ,
    i. ලිපි යැවීම.
    ii. මුදල් ලබා ගැනීම.
    iii. පින්තූර යැවීම.

www.lkedu.lk

iv. ලිපි සැකසීම.

57. මැටි යොදාගෙන තම නිවස සාදාගන්නා පක්ෂියා වන්නේ,
   i. කුඹලා
   ii. වඩු කුරුල්ලා
   iii. වැහි ලිහිණියා
   iv. කපුටා

58. කෙනෙකුගෙන් තව කෙනෙකුට බෝ විය හැකි රෝගයක් නොවන්නේ,
   i. සරම්ප
   ii. ජලභීතිකාව
   iii. සෙම්ප්‍රතිශ්‍යාව
   iv. කොරෝනා

59. සුළං හමන දිශාව සොයාගත හැක්කේ,
   i. අනිල මානය
   ii. සුළං දිශා දර්ශකය
   iii. පීඩනමානය
   iv. වර්ශාමානය

60. ගංගාවක් මුහුදට වැටෙන ස්ථානය හඳුන්වන්නේ,
   i. ඩෙල්ටා නමිනි.
   ii. මෝය නමිනි.
   iii. ගං දඟර නමිනි.
   iv. දූපත් නමිනි.

(ලකුණු 1*30 =30)

www.lkedu.lk